# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,467/15 - 2006 ඔක්තෝබර් 17 වැනි අඟහරුවාදා - 2006.10.17

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.9/96.

**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 23 වන වගන්තිය සමග කියවිය යුතු 25 වන වගන්තිය යටතේ සමාජ සේවා සහ සමාජ සුබසාධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඒ. පී. ජගත් පුෂ්පකුමාර,
සමාජ සේවා හා සමාජ සුබසාධන වැඩබලන අමාත්‍ය.

2006 සැප්තැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2006 අංක 01 දරන ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ නියෝගවල විධිවිධාන ආබාධ සහිත තැනැත්තන් ප්‍රවේශ වන ගොඩනැගිලිවලට, ප්‍රසිද්ධ ස්ථානවලට සහ පොදු සේවාවන් සහිත ස්ථානවලට අදාළ වේ.

එසේ වුව ද, දැනට පවතින සියලුම ප්‍රසිද්ධ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන සහ සේවාවන් සහිත ස්ථාන මේ නියෝග ක්‍රියාත්මක වීම ආරම්භවීමෙන් වසර තුනක් ඇතුළත නියෝගවලට අනුකූල වන පරිදි ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක, ප්‍රසිද්ධ ස්ථානයක හෝ පොදු සේවාවන් සහිත ස්ථානවල කොටසක් වන තාවකාලික ගොඩනැගිලිවලට හෝ කොන්ත්‍රාත්කරුවන්ගේ ආවරණවලට අදාළ නොවිය යුතු ය.

3. (1) කිසිම තැනැත්තකු විසින්, යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක පිහිටි ඉදිකිරීමකට අදාළ වන යම් සැලැස්මක් –

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කාර්යසාධන පිරිවිතර අනුව සකස් වී ඇත්නම් මිස, සහ

(ආ) මේ නියෝගවල I වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව සකස් වී ඇත්නම් මිස,

ඒ ප්‍රසිද්ධ ගොඩනැගිල්ල ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම හෝ නවීකරණය කිරීම නොකළ යුතු ය.

(2) කිසිම "අදාළ අධිකාරියක්" විසින් යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් ගොඩනැංවීම, ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ නවීකරණය කිරීම පිළිබඳ සැලැස්මක් –

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති කාර්ය සාධන පිරිවිතර අනුව සකස් වී ඇත්නම් මිස, සහ

(ආ) මේ නියෝගවල I වන උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව සකස් වී ඇත්නම් මිස,

අනුමත කිරීමේ සහතිකයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

4. (1) යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක, ප්‍රසිද්ධ ස්ථානයක හෝ පොදු සේවාවන් සහිත ස්ථානයක, රෝද පුටු, කිහිලිකරු සහ ඇවිදීමේ ආධාරක වැනි සංචරන උපකරණ භාවිත කරන තැනැත්තන් සඳහා මේ නියෝගවල I වන උපලේඛනයේ IIඅ කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට, ප්‍රමාණවත් ඉඩකඩ වෙන් කරනු ලැබිය යුතුය.

(2) යටත් පිරිසෙයින් ඒකක විස්සක් (20) ඇති සියලුම නිවාස යෝජනා ක්‍රමවල, යටත් පිරිසෙයින් සියයට පහක (5%) ප්‍රමාණයක්වත් නිවාස, මෙහි II වන උපලේඛනයේ IIආ කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම්වලට අනුව ඉදිකරනු ලැබිය යුතු ය.

5. යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක්, ප්‍රසිද්ධ ස්ථානයක් හෝ පොදු සේවාවක් සහිත ස්ථානයක පහත දැක්වෙන යම් කොටසක්, රෝද පුටු, කිහිලිකරු සහ ඇවිදීමේ ආධාරක වැනි සංචරන උපකරණ භාවිතා කරන තැනැත්තන්ට සහ වෙනත් තැනැත්තකුගේ සහාය ඇතිව ගමන් කරන තැනැත්තන්ට පහසුවෙන් ප්‍රවේශවීමට ඉඩ සලසාදීම සඳහා, මේ නියෝගවල II වන උපලේඛනයේ IIආ කොටසෙහි නිශ්චිතව දක්වා ඇති නිර්මාණ සැලසුම්වල අවශ්‍යතාවලට අනුව නිර්මාණය කරනු ලැබ තිබිය යුතු ය :–

1. රථගාල් කිරීමේ ස්ථාන ;
2. පෙත් මං සහ කොරිඩෝ ;
3. බිම් මහල් සහ උඩු මහල්වල බිම මතුපිට ;
4. පදික වේදිකා, ප්‍රසිද්ධ පාරවල් සහ පදිකයන් මාරුවන ස්ථාන ;
5. අත් වැටවල් හා ආධාරක පොලු ;
6. පඩි සහ තරප්පු ;
7. බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග ;
8. විදුලි සෝපාන සහ ආරෝහක ;
9. ප්‍රසිද්ධ ගොඩනැගිලිවල දොරටු හා ඇතුල්වන ස්ථාන ;
10. වැසිකිළි ;
11. උද්‍යාන, සත්වෝද්‍යාන, වෙනත් විනෝද වන ස්ථාන ;
12. බස් නැවතුම්පලවල් ;
13. දුම්රිය නැවතුම්පලවල් ;
14. ජනෙල්, නිදන කාමර, බේසම්, මුළුතැන්ගෙය, ගබඩා කිරීමේ ස්ථාන, මේස, ස්විච් සහ පිටත උපාංග, ආලෝක සැපයුම් සහ සන්නිවේදන පද්ධතිය.

6. යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලකට, ප්‍රසිද්ධ ස්ථානයක පිහිටි ඉදිකිරීමකට හෝ පොදු සේවාවන් සහිත ස්ථානයකට ආබාධ සහිත තැනැත්තකුගේ ප්‍රවේශවීමේ හැකියාව, යම් ප්‍රතිසංස්කරණ කටයුතු, අලුතින් කොටස් එකතු කිරීමේ කටයුතු, වෙනස් කිරීම්, වැඩිදියුණු කිරීම් හෝ නවීකරණය කිරීම් ආදී කටයුතු නිසා තාවකාලිකව බාධා වී ඇත්නම්, එම කටයුතු අවසන් කරන තෙක්, ප්‍රවේශවීම සඳහා විකල්ප වැඩපිළිවෙලක් සලස්වනු ලැබිය යුතු ය.

7. රජය විසින් පොදු ප්‍රවාහන පහසුකම්වලින් අවම වශයෙන් සියයට දහයක් (10%) II වන උපලේඛනයේ I වන කොටසේ දක්වා ඇති පරිදි සහ II උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිර්මාණ සැලසුම් අවශ්‍යතාවලට අනුව ආබාධිත පුද්ගලයින් සඳහා සපයා දිය යුතු ය.

8. (1) දෘෂ්ටි ඌනතා ඇති පුද්ගලයන්ගේ ප්‍රතිලාභය සඳහා ශ්‍රව්‍ය මාර්ග සංඥා සහ අනිකුත් ශ්‍රව්‍ය තොරතුරු පද්ධති සපයනු ලැබිය යුතු අතර, මෙහි III වන උපලේඛනයේ දක්වා ඇති ආරක්ෂක පියවර ද සලස්වනු ලැබිය යුතුය.

(2) ශ්‍රව්‍ය ඌනතා ඇති පුද්ගලයින්ගේ ප්‍රතිලාභය සඳහා ස්වයංක්‍රීය දර්ශක පද්ධති සපයා දිය යුතු ය. I වන උපලේඛනයේ IIආ කොටසේ දක්වා ඇති පරිදි රැස්වීම් ප්‍රදේශයන්හි ද සම්මන්ත්‍රණ සහ රැස්වීම් කාමරවල ද ආධාරක ශ්‍රවණ උපකරණ සවි කළ යුතු ය.

9. 2005 නොවැම්බර් මස 12 වන දින අංක 1419/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2005 අංක 1 දරන ආබාධ සහිත තැනැත්තන් විසින් ප්‍රසිද්ධ ස්ථානවලට හා පොදු සේවාවලට ප්‍රවේශවීම පිළිබඳ නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"ප්‍රවේශවීම" යන්නෙන් වෙනත් තැනැත්තකුගේ සහායවීමක් නොමැතිව යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලකට හෝ ප්‍රසිද්ධ ස්ථානයකට හෝ පොදු සේවාවන් සහිත ස්ථානයකට ඇතුල්වීමට, ළඟාවීමට ඔබ මොබ යාමට සහ එහි ඇති පහසුකම් සහ සේවාවලින් ප්‍රයෝජන ලබාගැනීමට තැනැත්තකුට ඇති හැකියාව අදහස් වේ,

"පොදු සේවාව" යන්නෙන් -

(*අ*) පොදු ප්‍රවාහන සේවා සහ එම පොදු ප්‍රවාහන සේවාවලට සම්බන්ධ පහසුකම් අදහස් වන අතර, මගී ප්‍රවාහන බස් රථ, මගී ප්‍රවාහන දුම්රිය, බස් නැවතුම්පලවල්, ඩිපෝ සහ පර්යන්ත දුම්රිය නැවතුම්පලවල්, මගී ප්‍රවාහන ගුවන් යානා, ගුවන් පර්යන්ත ගොඩනැගිලි සහ ගුවන් තොටුපලවල් ඊට ඇතුළත් වේ ; සහ

(*ආ*) පොදු සන්නිවේදන සේවා සහ එම සන්නිවේදන සේවාවලට සම්බන්ධ පහසුකම් අදහස් වන අතර, තැපැල් කාර්යාල, සන්නිවේදන මධ්‍යස්ථාන සහ දුරකථන කුටි ඊට ඇතුළත් වේ,

"ඌනතාව" යන්නෙන් මානසික හෝ කායික හෝ දේහමය ව්‍යුහය හෝ ක්‍රියාකාරිත්වය පිළිබඳ තාවකාලික *නැතහොත්* ස්ථිර අහිමිවීමක් හෝ විකෘතිභාවයක් අදහස් වන අතර, මානසික ක්‍රියාකාරිත්වය ද ඇතුළුව ශරීරයේ අතක් හෝ පයක් (ගාත්‍රාවක්) අවයවයක්, පටලයක් හෝ ශරීරයේ වෙනත් ව්‍යුහයක අඩුපාඩුවක් හෝ අහිමිවීමක් පැවතීම හෝ හටගැනීම ද ඊට ඇතුළත් වේ,

"ආබාධ සහිත තැනැත්තා" යන්නට 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය,

"ප්‍රසිද්ධ ගොඩනැගිල්ල" යන්නෙන් –

(i) සමූහ වාසස්ථාන සහ මහල් නිවාස ඒකක සහ පේළි නිවාසවල පිහිටි කාර්ය මණ්ඩල වාසස්ථාන ද ඇතුළුව, නේවාසික කාර්ය සඳහා භාවිතා කරනු ලබන ;

(ii) කාර්යාල ගොඩනැගිලි, හෝටල්, සංචාරක නේවාසික ස්ථාන, තානායම්, අමුත්තන්ගේ නිවාස සහ වෙනත් පොදු නවාතැන්පලවල්, සාප්පු සංකීර්ණ, සුපිරි වෙළඳසැල්, අවන්හල්, පොදු තොග හා සිල්ලර වෙළඳසැල් සහ රථගාල් ඇතුළු වාණිජ කාර්ය සඳහා භාවිත කරනු ලබන ;

(iii) කර්මාන්ත ශාලා, වෙනත් වැඩපලවල් සහ ගබඩා ඇතුළු කාර්මික කාර්ය සඳහා භාවිතා කරනු ලබන ;

(iv) අධ්‍යාපනික ආයතන, පාසල්, රෝහල්, සාත්තු නිවාස, වෛද්‍ය මධ්‍යස්ථාන, බෙහෙත් ශාලා, වැඩිහිටි නිවාස, පන්සල්, පල්ලි, මුස්ලිම් පල්ලි සහ වෙනත් ආගමික ස්ථාන, පොලිස් ස්ථාන, අධිකරණ ශාලා, රැස්වීම් ශාලා, ග්‍රාම ශාලා, ප්‍රජා මධ්‍යස්ථාන, ශ්‍රවණාගාර, සම්මේලන ශාලා, පුස්තකාල, කෞතුකාගාර, ප්‍රදර්ශන ශාලා, පොදු වැසිකිළි සහ වෙනත් යම් ගොඩනැගිලි වැනි ප්‍රජා සමාජමය සහ අධ්‍යාපනික කාර්ය සඳහා භාවිත කරනු ලබන ; සහ

(v) සිනමා ශාලා, නාට්‍යාගාර, ප්‍රසංග ශාලා, ඔපෙරා ශාලා, කලාගාර, ක්‍රීඩාංගන, ක්‍රීඩා සංකීර්ණ, ක්‍රීඩා කරන ස්ථාන සහ වෙනත් විනෝදාංශ සඳහා භාවිත වන ස්ථාන වැනි විනෝදාත්ක කාර්ය සඳහා භාවිතා කරනු ලබන

ගොඩනැගිලි අදහස් වේ,

"ප්‍රසිද්ධ ස්ථාන" යන්නෙන් පදිකයන් මාරුවන ස්ථාන, පෙත් මං, පදික වේදිකා, පාරවල්, වීදි, වීදිවලින් බැහැරව සහ වීදි මත පිහිටි රථගාල්, පිටත පිහිටි තරප්පු, පඩි පේළි, සෝපාන, මාර්ග සංඥා සහ සළකුණු, උද්‍යාන, උද්භිද උද්‍යාන, සත්වෝද්‍යාන, සංචාරකයන් ඇදී එන සහ ඔවුන්ගේ ආකර්ශනය සහිත ස්ථාන ආදිය අදහස් වේ,

"අදාළ අධිකාරිය" යන්නෙන් යම් පළාත් පාලන අධිකාරියක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අනුමතය ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා *නැතහොත්* පොදු වාහන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යය සඳහා පත් කරන ලද යම් නිලධරයකු, තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

## I වන උපලේඛනය

### *1 වන කොටස*

*ගොඩනැගිලි*

| *ගොඩනැගිලි වර්ගය* | *කාර්යසාධන පිරිවිතර* |
|---|---|
| 1. කාර්යය මණ්ඩල නිවාස, සමූහ නිවාස හා මහල් නිවාස ඒකක හා පේළි නිවාස | (*අ*) සෑම ඒකක 25කටම අවම වශයෙන් බාධක රහිත අංගෝපාංගවලින් යුක්ත ඒකක 01ක් සහ ඉන්පසු සෑම ඒකක 100කට ම එවැනි අතිරේක ඒකක 01ක් බැගින් ගොඩනැගීම කළ යුතු ය.<br>(*ආ*) ඇතුල්වීමේ සහ පිටවීමේ දොරටු ආබාධ සහිත පුද්ගලයන්ට ද භාවිත කළ හැකි පරිදි බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග සහිත විය යුතු ය. |
| 2. තැපැල් කාර්යාල, බැංකු සහ මූල්‍ය සේවා ආයතන | අවම වශයෙන් අඩු උසකින් යුක්ත 01 සේවා කවුන්ටරයක් හෝ පරිශ්‍රය තුළ තිබිය යුතු ය. |
| 3. කඩ සාප්පු සහ තනි තට්ටු සාප්පු | වෙළඳ සැල් ප්‍රදේශය ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි පරිදි විය යුතු ය. |
| 4. හෝටල් | සෑම අමුත්තන්ගේ කාමර 25කටම හෝ ඉන් කොටසක් අවම වශයෙන් ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සහිත සහ භාවිත කළ හැකි කාමර 01ක් සහ පොදු ප්‍රදේශයේ එවැනි ප්‍රවේශවිය හැකි වැසිකිළි එකක් තිබිය යුතු ය. |
| 5. ආහාර මධ්‍යස්ථාන | (*අ*) සෑම මේස 10කටම අවම වශයෙන් 01 මේසයක්වත් පොළවට සවිකොට ස්ටූල් හෝ ආසනවලින් තොරව තිබිය යුතු ය.<br>(*ආ*) මුළු පරිශ්‍රයටම අවම වශයෙන් මේස 02ක්වත් ස්ටූල් හෝ ආසනවලින් තොරව පොළවට සවි කර තිබිය යුතු ය. |
| 6. ප්‍රජා මධ්‍යස්ථාන, ග්‍රාම ශාලා, ශ්‍රවණාගාර, ප්‍රසංග ශාලා, රැස්වීම් ශාලා, සිනමාහල්, නෘත්‍යාගාර සහ පොදු මහජනතාව රැස්වන වෙනත් ස්ථාන | (*අ*) ප්‍රජාව හෙවත් පොදු ජනයා රැස්වන ප්‍රධාන ස්ථානවලට ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ඇතුළුවීමේ සහ පිටවීමේ දොරටු සහ දේවස්ථාන, පල්ලි ආදියේ ආසන අතර ඉඩකඩ ප්‍රවේශ විය හැකි ආකාරයෙන් පැවතිය යුතු ය.<br>(*ආ*) ප්‍රවේශ පහසුකම් සහිත වැසිකිළි පහසුකම් සපයනු ලැබ තිබිය යුතු ය.<br>(*ඇ*) ප්‍රධාන ඇතුළුවීමේ දොරටු අසල සහ ප්‍රවේශ ශාලාවල ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි පරිදි ආසන පහසුකම් සලසා තිබිය යුතු ය.<br>(*ඈ*) ආසන පනවා ඇති ප්‍රධාන ප්‍රදේශ මුළුල්ලේ රෝද පුටු භාවිත කරන අයට සිය කැමැත්ත අනුව වාඩි වී සිටීමට හෝ අවට බලමින් සිටීම සඳහා පහසුකම් සලසා තිබිය යුතු ය.<br>(*ඉ*) ආසන 100 සිට 400 දක්වා සංඛ්‍යාවකට පහසුකම් ඇති ඉඩ ප්‍රමාණයක අවම වශයෙන් රෝද පුටු 02ක් සඳහාවත් ඉඩ පහසුකම් සැලසිය යුතු ය.<br>(*ඊ*) ආසන 400ට වැඩි ආසන පහසුකම් ඇති ඉඩ ප්‍රමාණයක නම්, ඉන් සියයට එකක (1%) ප්‍රතිශතයක්වත් රෝද පුටු භාවිත කරන්නන් සඳහා වෙන් කළ යුතු ය.<br>(*උ*) රෝද පුටු සඳහා වෙන්කළ ඉඩකඩෙහි පහසුවෙන් එහා මෙහා කළ හැකි ආසන තිබිය යුතු ය.<br>(*ඌ*) "ඕඩියෝ ලූප්" ක්‍රමයක් සලස්වා තිබිය යුතු ය. |

*රථගාල් කිරීමේ ප්‍රදේශ*

සෑම රථ ගාල් කිරීමේ ප්‍රදේශයක ම ආබාධිත රියැදුරන් සහ මගීන් සඳහා නම් කරන ලද රථ ගාල් කිරීමේ ඉඩකඩ වෙන්කර තැබිය යුතු අතර එම ඉඩකඩ ප්‍රධාන ඇතුළුවීමේ සහ පිටවීමේ දොරටුවලට හැකි තරම් ආසන්නයෙන් ස්ථානගත කරනු ලැබිය යුතු ය. එසේ වෙන් කර තැබිය යුතු රථගාල් කිරීමේ ඉඩකඩවල අවම සංඛ්‍යාව පහත දැක්වෙන පරිදි විය යුතු ය.

| *විවෘත රථගාල්වල සහ රථගාල් කිරීමේ ගොඩනැගිලිවල ඇති මුළු රථගාල් කිරීමේ ඉඩකඩ සංඛ්‍යාව* | *ප්‍රවේශවිය හැකි පරිදි තැබිය යුතු රථගාල් කිරීමේ ඉඩකඩ සංඛ්‍යාව* |
|---|---|
| 01 සිට 25 | 1 |
| 26 සිට 50 | 2 |
| 51 සිට 75 | 3 |
| 76 සිට 100 | 4 |
| 101 සිට 150 | 5 |
| 151 සිට 200 | 5 |
| 201 සිට 300 | 6 |
| 301 සිට 400 | 7 |
| 401 සිට 500 | 8 |
| 500ට වැඩි | මුළු ප්‍රමාණයෙන් 2%ක් |


I වන උපලේඛනය

*II අ කොටස*


*සංචරන උපකරණ භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැලසීම*

(9 වන නියෝගය)


(1) රෝද පුටු, අත්වාරු හා ඇවිදීමේ ආධාරක වැනි සංචරන උපකරණ භාවිත කරන අය මෙන්ම, අන්‍ය පුද්ගලයන්ගේ සහාය ඇතිව ඇවිදින අය සඳහා ප්‍රමාණවත් ඉඩක් වෙන්කර තැබිය යුතු ය. (1, 2 සහ 3 රූප සටහන්) (දේශීය වශයෙන් භාවිත කෙරෙන රෝද පුටුවල දිග පළල සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය.).




1 වන රූප සටහන - තැබිය යුතු ඉඩ ප්‍රමාණය





2 වන රූප සටහන - තැබිය යුතු ඉඩ ප්‍රමාණය





3 වන රූප සටහන - තැබිය යුතු ඉඩකඩ


(2) රෝද පුටුවක් භාවිත කරන අයකුට (ඉස්සරහට හා පැත්තට, බාධකයක් සහිතව හෝ රහිතව) ළඟා විය හැකි ප්‍රදේශ සැළකිල්ලට ගත යුතු ය. (4, 5, 6 හස 7 රූප සටහන්)





4 වන රූප සටහන - බාධකවලින් තොරව ඉදිරියට යාම




5 වන රූප සටහන - බාධකය අභිබවා ඉදිරියට යාම





6 වන රූප සටහන - බාධකයකින් තොරව පැත්තක් කරා ළඟාවීම





7 වන රූප සටහන - බාධකයන් අභිබවා පැත්තෙන් ළඟාවීම

(3) ශ්‍රවණාගාර, රැස්වීම ශාලා, නෘත්‍යාගාර හා ඒ සමාන ස්ථානයන්හි රෝද පුටු සඳහා ඉඩකඩ තැබිය යුතු ආකාරය :–

තමන්ට කැමැති ගාස්තුවක් ගෙවා වාඩිවිය හැකි පරිදි විවිධ මට්ටමේ ආසන පංති සමග ශාරීරික දුබලතා ඇති පුද්ගලයන් සඳහා වාඩි වී සිටීමට ආසන සපයා තිබිය යුතු ය. (8 වන හා 9 වන රූප සටහන්)




8 වන රූප සටහන - ශ්‍රවණාගාරවල රෝද පුටු සඳහා ඉඩකඩ සැලසීම




9 වන රූප සටහන - ශ්‍රවණාගාරයේ හා නෘත්‍යාගාරයක තබා ඇති ඉඩකඩ

1 වන උපලේඛනය

*II ආ කොටස*


*ප්‍රසිද්ධ ගොඩනැගිලිවල, ප්‍රසිද්ධ ස්ථානවල සහ පොදු සේවාවන් සහිත ස්ථානවල අනුගමනය කළ යුතු නිර්මාණ සැලසුම් අවශ්‍යතා*

1. රථගාල් කරන ස්ථාන :

(අ) ගොඩනැගිල්ලකට හෝ පහසුකමකට ඉතා ළඟින්ම පිහිටි මාර්ගයේ ප්‍රවේශ පහසුකම් පිහිටා තිබිය යුතු අතර, හැකි සෑම විටම උඩින් වහලයක් සහිතව තිබිය යුතු යි.

(ආ) ආබාධිත අයකුට මෝටර් රථයකට නැගීමට හා මෝටර් රථයකින් බැසීමට හැකිවන පරිදි ප්‍රමාණවත්, බාධා විරහිත ඉඩ ප්‍රමාණයක් රථගාල් වටා තිබිය යුතු යි. (10 වන රූප සටහන - සීබ්‍රා කලාපය).

(ඇ) ආබාධ සහිත පුද්ගලයන් ගෙනයන වාහනය සඳහා ගාල් කිරීමේ ඉඩකඩ වෙන් කොට තැබිය යුතු අතර, විශ්වමය වශයෙන් පිළිගත් සංකේතයක් මගින් එම ඉඩකඩ පිළිබිඹු කළ යුතු යි.





10 වන රූප සටහන - රථ ගාල් කිරීම

2. පෙත් මං සහ කොරිඩෝ


(අ) පෙත් මං සහ කොරිඩෝ රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් වන තරමට පුළුල් විය යුතු ය. (11 වන රූප සටහන)

(ආ) කොරිඩෝව මි. මී. 1,500 (අවම හැරවීමේ ඉඩකඩට) අඩු නම්, තැනින් තැන (ප්‍රමාණවත් පරිදි) හැරවීමේ ඉඩකඩ සපයා තිබිය යුතු ය. (12 - 16 දක්වා රූප සටහන්)


(ඇ) පෙත් මං හෝ කොරිඩෝවල මතුපිට බිම, “පොළොව හා ගෙබිම මතුපිට” සම්බන්ධ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.





11 වන රූප සටහන - තනිරෝද පුටුව සඳහා අවශ්‍ය අවම අවකාශයේ පළල





12 වන රූප සටහන - රෝද පුටු දෙකක් සඳහා තිබිය යුතු අවම හිස් අවකාශයේ පළල





13 වන රූප සටහන - 90° ක හැරවීමක් සඳහා හිස් ඉඩකඩ




14 වන රූප සටහන - බාධකයක් වටා හැරවීම සඳහා තැබිය යුතු ඉඩ




15 වන රූප සටහන - අභ්‍යන්තර ප්‍රවේශවීමේ ශාලා (ලොබිස්)




16 වන රූප සටහන - ප්‍රවේශවිය හැකි මාර්ගයේ මට්ටමේ වෙනස්වීම

3. පොළොව හා ගෙබිම මතුපිට

(අ) බිම් මහල් හා උඩු මහල් මතුපිට බිමේ (උඩු මහල් ද පයින් යන මාර්ග ද, බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග ද තරප්පුද ගැටි බෑවුම් ද ඇතුළත් ව ප්‍රවේශ විය හැකි ස්ථාන සහ කාමර හා අවකාශයන් ද ඔස්සේ) ස්ථාවර තත්ත්වයක්, දැඩි හා නොලිස්සන සුළු ස්වභාවයක් තිබිය යුතු ය.

(ආ) මි. මී. 6 දක්වා වූ තිරස් මට්ටමේ වෙනස්වීම් සඳහා කෙළවරවල් සකස් කිරීමක් අවශ්‍ය නොවේ. මි. මී. 6 සිට 13 අතර මට්ටම් වෙනසක් ඇති විට 1:2 අනුපාතයට නොවැඩි බෑවුමක් සහිතව මට්ටම් කළ යුතු ය.

(ඇ) පෙත් මං වල ගරාදි (ග්‍රේටිං) තබන්නේ නම් ඒවායේ රෝද පුටුවක රෝදවලට වඩා විශාල නොවූ අවකාශ (උදා. මි. මී. 13ක්) තිබිය යුතු ය.

(ඈ) කාබට් හෝ කාබට් කැලි උඩුමහල්වල ගෙබිම මතුපිට භාවිතා කරන්නේ නම් ආරක්ෂිත අන්දමට ඒවා සවිකළ යුතු ය. සංචරන හා දෘශ්‍ය ඌනතා සහිත පුද්ගලයන් නිතරම ගැවසිය හැකි තැන්වල දිග සන පාපිසි නොදැමිය යුතු ය.

(ඉ) වෙනස් වර්ණ හා ආකෘතීන් භාවිතය මගින් පාරවල්වල කෙළවර පැහැදිළිව දැක්විය හැකි ය.


(ඊ) වීදි ආසන ආදිය, ගස්, ආලෝකය හා කුණු කූඩ ඇවිදින මාර්ගවල එක් පැත්තක තිබිය යුතු ය. මතුපිට ආකෘතිය හා පිටත වර්ණ එකී දේවල්වලට ළඟා විය හැකි ආකාරය දැක්වෙන සේ වෙනස් කළ යුතු ය.

4. පදික වේදිකා, පොදු මාර්ග හා පදිකයන් මාරුවන ස්ථාන


(අ) ප්‍රවේශවිය හැකි මාර්ගයක හරහට ගැට්ටක් යොදා ඇති හැමවිටම එම ගැට්ට හරහා බෑවුමක් සහිත ප්‍රවේශයක් සපයා තිබිය යුතු ය. (17 වන රූප සටහන).

(ආ) බෑවුමක් සහිත ප්‍රවේශය මාර්ගයක බෑවුම ඉතා සුළු විය යුතු ය. (18 වන රූප සටහන).

(ඇ) බෑවුමක් සහිත ප්‍රවේශය මාර්ගයක මතුපිට "පොළොව හා ගෙබිම මතුපිට" පිළිබඳ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.




17 වන රූප සටහන - බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගය




18 වන රූප සටහන - ලකුණු කළ පදික මාරුවල ගැටි හරහා තැබිය යුතු බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග

5. අත්වැටවල් හා ආධාරක පොලු


(අ) අත්වැටක් හෝ ආධාරකයක් පහසුවෙන් අල්ලාගෙන ප්‍රයෝජනයට ගත හැකි පරිදි විශ්කම්භයකින් හෝ පළලකින් හා ශක්තියකින් යුක්ත විය යුතු ය. (19 වන රූප සටහන)

(ආ) අත්වැටවල් හෝ ආධාරක පොලු බිත්තියක් අසල වේ නම් බිත්ති හා පොල්ල අතර, හිස් අවකාශයක් සළසා තිබිය යුතු ය.

(ඇ) අත්වැටවල් හෝ ආධාරක පොලු ඇතුලතට නෙරා ගිය ගර්භයක් තුළ සවිකර ඇත්නම් එම ගර්භයේ උපරිම හා අවම ගැඹුර සැළකිල්ලට ගත යුතු ය. (19 වන රූප සටහන).

(ඈ) සෑම වැටකම හෝ ආධාරක පොල්ලකම පිහිටීම, දෘශ්‍ය ඌණතා ඇති අයට පෙන්නුම් කිරීම සඳහා එහි මුල හා අග කුඩා බ්‍රේල් තහඩුවක් සවිකර තිබිය යුතු ය.

(ඉ) අත්වැටවල් හෝ ආධාරක පොලු, අවට ප්‍රදේශය හමුවේ තදින් කැපී පෙනෙන ප්‍රතිවිරුද්ධ වර්ණයකින් යුක්ත විය යුතුය.




19 වන රූප සටහන

6. පඩි හා තරප්පු (20 වන රූප සටහන)

(අ) පඩි පෙළක පඩිවල උස මෙන්ම, නැග්ම ද පඩි මතුපිට ද එක සමාන විය යුතුය.

(ආ) පඩි පෙළක් අඩු බෑවුමකින් යුක්ත විය යුතු ය.

(ඇ) පඩි පෙළක පඩි අතර විවෘත ඉඩකඩ නොතිබිය යුතු ය.

(ඈ) පඩිවල කොන් පිටතට නෙරිය යුත්තේ හැකිතාක් සුළු වශයෙනි.

(ඉ) පඩි පෙළක දෙපැත්තේ ම අත්වැටවල් පඩි ආරම්භ වන තැන සිට පහසුවෙන් අල්ලා ගත හැකි සුදුසු උසක තිබිය යුතු ය.

(ඊ) පඩිපෙළවල් සඳහා වූ අත්වැටවල් පඩි ආරම්භ වන තැන සිට පහසුවෙන් අල්ලා ගත හැකි සුදුසු උසක තිබිය යුතු ය.

(උ) අත්වැටවල් පඩි පෙළේ මුදුන හා පතුල ඉක්මවා යන පරිදි තැනිය යුතු ය.

(ඌ) පඩිපෙළේ නැවතුම් ප්‍රදේශ දෙකක් අතර නැග්ම සුදුසු උසකින් යුක්ත විය යුතු ය.


(එ) මධ්‍ය නැවතුම් ප්‍රදේශයක යටත් පිරිසෙයින් පඩි පෙළේ පළලටවත් සමාන පළලක් හා ගැඹුරක් තිබිය යුතු ය.

(ඒ) අත්වැටවල් සඳහා වූ අනෙකුත් අවශ්‍යතා "අත්වැටවල්" සඳහා වූ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.

(ඔ) පඩිවල උඩ පැත්ත "පොළොව හා ගෙබිම මතුපිට" සඳහා වූ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.

(ඕ) පඩිවල කෙළවරවල් පැහැදිලිව කැපී පෙනෙන පාට වලින් යුක්ත විය යුතු ය.

(ක) පඩිපෙළවල් ප්‍රමාණවත් ලෙස ආලෝකමත් කර තිබිය යුතු ය.




20 වන රූප සටහන - තරප්පු

7. බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග (21 වන රූප සටහන)

(අ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් සාමාන්‍ය බෑවුමකින් යුක්ත විය යුතු අතර, සෑම මීටර් 10කට ම පසු නැවතුම් ප්‍රදේශයක් තිබිය යුතු ය.

(ආ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක රෝද පුටුවක් සඳහා ප්‍රමාණවත් වන පළල තිබිය යුතු ය.

(ඇ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක දෙපසම අත් වැටවල් තිබිය යුතු ය. විවෘත කෙළවරවල් සඳහා උස් වූ ගැටි තිබිය යුතු ය.


(ඈ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගවලට යොදා ඇති අත්වැටවල් රෝද පුටු භාවිත කරන්නන්ට හා කිහිලිකරු භාවිත කරන්නන්ට පහසුවෙන් අල්ලා ගත හැකි නිවැරදි උසකින් යුක්ත විය යුතු ය.

(ඉ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයේ මුදුන හා පතුල ඉක්මවා යන පරිදි අත්වැටවල් තිරස් අතට විහිදිය යුතු ය.

(ඊ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගය මතුපිට නොලිස්සන සුළු විය යුතු ය.

(උ) අත්වැටවල අනෙකුත් අවශ්‍යතා "අත්වැටවල් හා ආධාරක පොලු" පිළිබඳ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.

(ඌ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ග හා එම මාර්ග වලින් බැසිය යුතු මතුපිට "පොළොව හා ගෙබිම මතුපිට" පිළිබඳ නිර්මාණ සැලසුම්වලට අනුකූල විය යුතු ය.




21 වන රූප සටහන - බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගය

8. විදුලි සෝපාන සහ ආරෝහක

(අ) විදුලි සෝපානයේ බිම් අවකාශය රෝද පුටු භාවිත කරන්නන්ට සෝපානයට ඇතුළුවීමටත්, එය හැසිරවීමටත් පාලන බොත්තම් කරා ළඟාවීමටත්, පිටවීමටත් ප්‍රමාණවත් තරමට තිබිය යුතු ය. (22 වන රූප සටහන)

(ආ) සෝපාන දොරවල් රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රමාණවත් තරමට පුළුල් විය යුතු ය. (23 වන රූප සටහන)

(ඇ) සෝපාන දොර වැසීම පිළිබඳ ක්‍රියාවලින්, රෝද පුටු භාවිත කරන්නන්ට ඇතුළුවීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලැබෙන ආකාරයට සකස් කිරීමට හැකි විය යුතු ය. සෝපාන දොර වැසීම පාලනය කිරීම සඳහා "ඡායා විදුලි සෙන්සරයක්" සවිකළ හැකිය.

(ඈ) විදුලි සෝපාන ශාලාවල, රෝද පුටු භාවිත කරන්නන්ට ඇතුළුවීමේ හා සෝපාන පාලනය හැසිරවීමේ ඉඩකඩ සැපයිය යුතු ය.


(ඉ) සෝපාන ශාලාවල ඇති ඇමතීම් බොත්තම් රෝද පුටු භාවිත කරන්නන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි උසකින් තිබිය යුතු ය. (23 වන රූප සටහන).

(ඊ) සියලුම පාලන බොත්තම් වල බ්‍රේල් ක්‍රමය ඇතුළත් විය යුතු අතර, අංක හා "විවෘත කරන්න" සහ "වසන්න යන්න" දැක්වෙන සංකේත උස් කොට දක්වා තිබිය යුතු ය.


(උ) පාලන බොත්තම් සහිත කොටසට හෝ දොරට උඩින්, සෝපාන ඒ ඒ අවස්ථාවේ තිබෙන තැන දැක්වෙන දර්ශකයක් තිබිය යුතු ය.

(ඌ) කවර තට්ටුවක සෝපාන තිබේද යනු දැනුම් දෙන ශබ්ද දර්ශකයක් ද පිහිටුවිය හැකි ය.

(එ) ගින්නක් හට ගතහොත් සංචරන ආබාධ ඇති පුද්ගලයන් ඉවත් කිරීම සඳහා ගිනි ආරක්ෂිත සෝපාන භාවිත කිරීමට අවකාශ දෙන ලෙස ගිනි නිවීමේ අධිකාරීන් හා එකඟත්වයකට පැමිණිය යුතු ය.




22 වන රූප සටහන - විදුලි සෝපානවල අවකාශය තැබිය යුතු අන්දම




23 වන රූප සටහන - විදුලි සෝපානවල පාලන පුවරුවේ හා අත්වැටේ උස

9. ප්‍රසිද්ධ ගොඩනැගිලිවල දොරටු හා ඇතුල්වන ස්ථාන

(අ) දොරටු රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් වන පරිදි පුළුල් විය යුතු ය. (අවම මි. මී. 900) (24 වන රූප සටහන).

(ආ) දොරවල් ඉදිරිපිට දොර අල්ලු එහා මෙහා කිරීම ප්‍රමාණවත් ඉඩකඩ සහිතව දොරවල් හැසිරවීමේ අවකාශය තැබිය යුතු ය. (25 වන රූප සටහන).

(ඇ) දොරටුවේ එළිපත මි. මී. 20කට වඩා උස් නොවිය යුතු ය. උස් එළිපත්තක් හා දොරටුවේ බිම් මට්ටමේ වෙනස්වීම් එම එළිපත දෙපැත්තේම බෑවුම් සකස් කිරීම මගින් අඩු කළ යුතු ය. එය සරළ, එමෙන්ම එහා මෙහා කළ හැකි හෝ බෑවුම් සහිත ප්‍රවේශයක් විය හැකි ය.


(ඈ) දොර අල්ලු මගින් තල්ලු කරන දොරවල් හා වෙනත් විවෘත කිරීමේ ක්‍රම, ශක්තිය හා පාලනය කිරීමේ දක්ෂකම අඩු අයෙකුට පාලනය කිරීමට හැකි පරිදි සුදුසු හැඩයකින් හා උසකින් යුක්ත විය යුතු ය. (25 වන රූප සටහන).

(ඉ) ලීවර් අල්ලු හා තල්ලු කරන වර්ගයේ යාන්ත්‍රණ නිර්දේශ කෙරේ. රඳවන දොරක් සම්පූර්ණයෙන් විවෘත වූ විට අල්ලු දෙපැත්තෙන්ම පාවිච්චි කළ හැකි විය යුතු ය.


(ඊ) දෘශ්‍යාබාධිත පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට අවම බිත්ති වලින් දොර වෙන්ව කැපී පෙනීම සඳහා වර්ණ භාවිතය ඉතා වැදගත් ය.

(උ) වීදුරු දොරවල් ඉතා දීප්තිමත්, වර්ණවත් ඒවා විය යුතු ය.


(ඌ) භ්‍රමණය වන දොරවල් හෝ කැරකුම් කවුළු භාවිත කෙරෙන විට රෝද පුටුවලට ප්‍රවේශ විය හැකි විකල්ප දොරටු සපයා තිබිය යුතු ය.




24 වන රූප සටහන - තල්ලු කරන දොර




25 වන රූප සටහන - දොරටු




26 වන රූප සටහන - දොරටුවල පිටත

10. පොදු වැසිකිළි (27 වන රූප සටහන)

(අ) පොදු වැසිකිළිවල පිටත, රෝද පුටු ප්‍රවේශය සඳහා විශ්වමය වශයෙන් පිළිගත් සංකේතයක් ප්‍රදර්ශනය කළ යුතු ය.

(ආ) වැසිකිළි හෝ නාන කාමරවල රෝද පුටු භාවිත කරන්නන්ට ඇතුළුවීමට හා පිටවීමට ප්‍රමාණවත් බිම් අවකාශයක් තිබිය යුතු ය.

(ඇ) වැසිකිළි භාජනය රෝද පුටු භාවිතා කරන්නන්ට එයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයේ එකක් විය යුතු ය (උදා. බිත්තියේ එල්ලන)

(ඈ) වැසිකිළි භාජනයේ ආසනය රෝදපුටු භාවිත කරන්නන්ට ගැලපෙන නිවැරදි උසකින් තිබිය යුතු ය.

(ඉ) වැසිකිළි කාමර සඳහා රෝද පුටු භාවිත කරන්නන්ට හා වෙනත් කායික ආබාධ වලින් යුත් පුද්ගලයන්ට සුදුසු උසකින් ආධාරක අත්වැටක් තිබිය යුතු ය. රෝද පුටුවකින් පැත්තට මාරුවීමට අවකාශ සැලසීම සඳහා උඩ අතට හැකිලෙන ආධාරක පොදු නිර්දේශ කෙරේ.

(ඊ) ශාරීරික ඌනතා ඇති අයකුට වැසිකිළියේ වාඩිවී සිටිමින්ම පහසුවෙන් ගත හැකි වන පරිදි වැසිකිළි කඩදාසි රඳවනය සවිකොට තිබිය යුතු ය.

(උ) සබන් රඳවනයත්, විදුලි අත් වියලුම් යන්ත්‍රය සහ කන්නාඩිය රෝද පුටු භාවිත කරන්නකුට පහසුවෙන් භාවිත කළ හැකි පරිදි තිබිය යුතු ය.


(ඌ) සේදුම් බේසම, රෝද පුටු භාවිත කරන්නකුට පහසුවෙන් ප්‍රවේශ විය හැකි උසකින් තිබිය යුතු ය.

(එ) සේදුම් බේසම සඳහා ලීවර් වර්ගයේ කරාම සවිකළ යුතු ය.

(ඒ) පොළොව නොලිස්සන සුළු ද්‍රව්‍යයකින් නිමකොට තිබිය යුතු ය.

(ඔ) දොරවල් තල්ලු කරන හෝ පිටතට විවෘත වන වර්ගයේ ඒවා විය යුතු ය.

(ඕ) වැසිකිළි දොරවල් හෝ කුටිවල අගුල්, හදිසියක දී පිටත සිට විවෘත කළ හැකි වර්ගයේ ඒවා විය යුතු ය.




27 වන රූප සටහන - පොදු වැසිකිළි

11. විනෝද ස්ථාන (උද්‍යාන, සත්වෝද්‍යාන සහ වෙනත් විනෝද වන ස්ථාන)

(අ) උද්‍යානයකට හෝ උද්‍යාන මාර්ගයකට එළඹෙන ස්ථානය අවට බිම් මට්ටමේ වෙනසක් නොතිබිය යුතු ය. බිම් මට්ටමේ වෙනසක් තිබීම නොවැළැක්විය හැකි නම් බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් හෝ පඩි පෙළක් සමඟ බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතු ය.

(ආ) පොළොව සැකසීමේ දී නොලිස්සන ද්‍රව්‍ය භාවිත කළ යුතු ය.

(ඇ) පඩි වැනි මට්ටමේ වෙනසක් ඇති ස්ථානවල කැපී පෙනෙන ප්‍රතිවිරුද්ධ වර්ණ භාවිතයෙන් හා මාර්ගෝපදේශක ගල් භාවිතයෙන් පොළොවේ විෂමතාව පෙන්නුම් කළ යුතු ය.

(ඈ) ඇතුල්වන ස්ථාන හා පෙත් මං රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් පළලින් යුක්ත විය යුතු ය.

(ඉ) උද්‍යාන මාර්ග ප්‍රවේශවල ජලවහන අගල් ඉදි නොකළ යුතු ය. ජලවහන අගලක් ඉදිකළ යුතු වේ නම් එයට ආවරණයක් ඉදිකළ යුතු ය.

(ඊ) අගල් හෝ ජලවහන ආවරණවල කට්ට, අත්වාරු හෝ රෝද පුටුවල රෝද හිර නොවන තරමට පටු විය යුතු ය.

(උ) සලසා ඇති පහසුකම් පිළිබඳ තොරතුරු පුවරුවක් තිබිය යුතු ය. ප්‍රමාණවත් විශාලත්වයෙන් යුත් අකුරු, කැපී පෙනෙන වෙනස හා ආලෝකකරණය මගින් එය පහසුවෙන් කියවිය හැකි වන ආකාරයට නිර්මාණය කළ යුතු ය. බ්‍රේල් ක්‍රමයෙන් ද මෙම තොරතුරු දැක්විය යුතු ය.


(ඌ) බංකු, කුණු කූඩ හා බොන වතුර සපයන වතුර මල් රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රයෝජනයට ගත හැකි ආකාරයට ප්‍රමාණවත් ඉඩකඩක් සහිතව පිහිටුවා තිබිය යුතු ය. (28 වන රූප සටහන)

(එ) උද්‍යාන මාර්ග පසෙකින් බංකු සවිකොට තිබිය යුතු ය.

(ඒ) දෘශ්‍ය ඌනතාවයක් ඇති පුද්ගලයන් සඳහා මාර්ගෝපදේශ ගල් සවි කළ යුතු ය.

(ඔ) විනෝද ස්ථානවල අවශ්‍ය තැන්වල අත්වැටවල් ඉදිකළ යුතු ය. (“අත්වැටවල්” සඳහා නිර්මාණ සැලසුම් බලන්න.)

(ඕ) විනෝද ස්ථානවල රථ ගාල් කිරීම සම්බන්ධයෙන් “රථ ගාල් කිරීමේ ස්ථාන” පිළිබඳ නිර්මාණ සැලසුම් බලන්න.





28 වන රූප සටහන - බොන වතුර සහිත වතුර මල

12. බස් නැවතුම්පලවල්

(අ) බස් නැවතුම්පලෙහි කණුවෙන් මී. මී. 300ක් එපිටින් ඇවිදින පැති මාර්ගයේ දෘෂ්‍ය ඌණතා සහිත පුද්ගලයන් සඳහා මාර්ගෝපදේශක ගල් පේළි දෙකක් සැපයිය යුතු ය.

(ආ) බස් නැවතුම්පළෙහි කුළුණ අඳුරු වැටුන පසුව පැහැදිලිව දිස්විය යුතු ය.

(ඇ) බස් නැවතුම්පල වහළයකින් හා බංකුවකින් යුක්ත විය යුතු ය. (29 වන රූප සටහන)




29 වන රූප සටහන - බස් නැවතුම්පල

13. දුම්රිය නැවතුම්පල

(1) දුම්රිය ස්ථානයට ප්‍රවේශය :–

(අ) ප්‍රවේශයෙහි මට්ටම එක සමාන විය යුතු ය. මට්ටම් වෙනස්වීම නොවැලැක්විය හැකි නම් බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් හෝ එවැන්නක් සමඟ පඩිපෙළක් ඉදිකළ යුතු ය.

(ආ) බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයන් සඳහා වූ නිර්මාණ සැළසුම්වලට ද "පඩි හා තරප්පු" ඒ පිළිබඳ නිර්මාණ සැලසුම්වලට ද අනුකූල විය යුතු ය.)

(2) ගල් ඇල්ලූ මතුපිට :-

(අ) අඩි පාරවල් නොලිස්සන සුළු ද්‍රව්‍ය වලින් තැනිය යුතු ය. පඩිපෙළවල් පොළවට සම්බන්ධ වන තැන් වැනි මට්ටමේ වෙනසක් ඇති තැන්වල මතුපිට, එම ප්‍රදේශයේ එළඹීමට ආසන්නතම හා එම ප්‍රදේශය අවසාන කිරීමට ආසන්නතම වූ ස්ථාන සඳහා ප්‍රතිවිරුද්ධ වර්ණ භාවිතයෙන් කැපී පෙනෙන්නට සැලැස්විය යුතු ය.

(ආ) ප්‍රවේශ අඩිපාරෙහි දෘෂ්ටි ඌණතා සහිත පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ගෝපදේශක ගල් තිබිය යුතු ය. ("මාර්ගෝපදේශක ගල්" පිළිබඳ නිර්මාණ සැළසුම බලන්න.)

(ඇ) ප්‍රවේශ අඩිපාර වාහන සඳහා වූ මාර්ගයට සමාන්තර නම් ආරක්ෂක අත්වැටවල් සවිකිරීමෙන් පදිකයන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කළ යුතු ය.

(3) දුම්රිය ස්ථානයට ඇතුල්වීම හා පිටවීම :–

(අ) ඇතුල්වන හා පිටවන ස්ථානවල පොළොව මට්ටමෙ වෙනසක් නොතිබිය යුතු ය. මට්ටමේ වෙනස නොවැලැක්විය හැකි නම් බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් හෝ එවැන්නක් සමඟ පඩිපෙළක් ඉදිකළ යුතු ය.

(ආ) ඇතුල්වන හා පිටවන ස්ථාන අසළ රෝද පුටු භාවිතා කරන්නන් ගෙන යන වාහන සඳහා ඉඩකඩ ලකුණු කළ යුතු ය. (අනෙකුත් විස්තර සඳහා "රථ ගාල්" නිර්මාණ සැලසුම් බලන්න.)

(4) ආබාධිත පුද්ගලයන් සඳහා වූ ප්‍රවේශය (30 වන රූප සටහන) :-

(අ) ප්‍රවේශයේ පළල යටත් පිරිසෙයින් මි. මී. 1,800ක් වත් විය යුතු ය.

(ආ) ප්‍රවේශයේ මට්ටමේ වෙනසක් නොතිබිය යුතු ය. මට්ටමේ වෙනස නොවැලැක්විය හැකි නම් බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් හෝ බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් සහ පඩිපෙළක් සකස් කළ යුතු ය. (මෙය බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගය පිළිබඳ නිර්මාණ සැලසුම්වලටත්, පඩිපෙළ "පඩි හා තරප්පු" පිළිබඳ නිර්මාණ සැලසුම්වලටත් අනුකූලව සකස් කළ යුතු ය.)

(ඇ) ප්‍රවේශයේ පොළොව මතුපිට නොලිස්සන ද්‍රව්‍යයකින් සෑදිය යුතු ය. පඩි වැනි මට්ටමේ වෙනසක් ඇති ස්ථානවල මතුපිට පෙනුම ප්‍රතිවරුද්ධ වර්ණ භාවිතයෙන් කැපී පෙනෙන්නට සැලැස්විය යුතු ය.

(ඈ) කණු සහ සංඥා පුවරු හා අනිකුත් සවිකිරීම් බිත්ති මතු පිටින් නෙරා ගොස් නැති බවට සහතික විය යුතු ය. (නෙරා ගිය වස්තූන් බලන්න.)

(ඉ) දෘෂ්ටි ඌණතා සහිත අයගේ ප්‍රයෝජනය සඳහා ප්‍රවේශය මත මාර්ගෝපදේශක ගල් සවි කළ යුතු ය. ("මාර්ගෝපදේශක ගල්" පිළිබඳ නිර්මාණ සැලසුම බලන්න.)

(5) පඩි

විස්තර සඳහා "පඩි හා තරප්පු" පිළිබඳ නිර්මාණ සැලසුම බලන්න.

(6) විදුලි සෝපාන (ආරෝහක)

(අ) ආබාධ සහිත පුද්ගලයන්ට එක් තට්ටුවකින් තවත් තට්ටුවකට යාම සඳහා විදුලි සෝපානයක් (ආරෝහකයක්) සවි කරන්න.

(ආ) විදුලි සෝපානයේ ඇමතීම් බොත්තමට මි. මී. 300ක් ඈතින් දෘෂ්ටි ඌණතා ඇති පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා මාර්ගෝපදේශක ගල් දෙකක් සවි කරන්න.

(ඇ) අනෙකුත් විස්තර සඳහා "විදුලි සෝපාන" පිළිබඳ නිර්මාණ සැලසුම බලන්න.

(7) වැසිකිළි

(අ) රෝද පුටු භාවිතා කරන්නන්ගේ හා අනෙකුත් මගීන්ගේ ප්‍රයෝජනය සඳහා වැසිකිළියක්, සෝදන ස්ථානයක් සාදන්න.

(ආ) වැඩිදුර තොරතුරු සඳහා "පොදු වැසිකිළි" පිළිබඳ නිර්මාණ සැලසුම බලන්න.

(8) ආසන වෙන් කිරීමේ හෝ තොරතුරු සැපයීමේ කවුන්ටර

(අ) රෝද පුටු භාවිතා කරන්නන්ට ආසන වෙන් කිරීම් හෝ තොරතුරු සැපයීම් කවුන්ටරවලට බාධක රහිතව එළඹීමට හැකියාව තිබිය යුතු ය.

(ආ) කවුන්ටරවල උස මි. මී. 850ක් නොඉක්මවිය යුතු ය.

(9) ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ගේට්ටු

(අ) යටත් පිරිසෙයින් ප්‍රවේශ පත්‍ර ගේට්ටුවලින් එකකවත්, රෝද පුටු භාවිත කරන්නන්ට පහසුවෙන් ඇතුළුවියහැකි තරමකට ප්‍රමාණවත් පළලින් යුක්ත විය යුතු ය.

(ආ) එක් ගේට්ටුවක දෘෂ්ටි ඌනතා ඇති පුද්ගලයන් සඳහා අඛණ්ඩ මාර්ගෝපදේශක ගල් පේලියක් තිබිය යුතු ය.

(ඇ) අනෙකුත් විස්තර සඳහා මාර්ගෝපදේශක ගල් පිළිබඳ නිර්මාණ සැලසුම් බලන්න.

(10) ටිකට් විකිණීමේ යන්ත්‍ර (31 වන රූප සටහන)

(අ) කාසි දැමීම සඳහා වූ කට්ටය රෝද පුටු භාවිත කරන්නන් විසින් පහසුවෙන් කාසි දමනු ලැබිය හැකි පරිදි සුදුසු උසකින් තිබිය යුතු ය. (31 රූප සටහන)

(ආ) ටිකට් විකිණීමේ යන්ත්‍රයට පහළින් දණහිස් තැබීම සඳහා ඉඩක්, තිබිය යුතු ය.

(ඇ) ටිකට් විකිණීමේ යන්ත්‍රයෙන් මි. මී. 300ක් ඈතින් දෘෂ්ටි ඌණතා සහිත පුද්ගලයන් සඳහා මාර්ගෝපදේශක ගල් සවිකළ යුතු ය.

(ඈ) ගාස්තු බොත්තම්, අවලංගු කිරීමේ බොත්තම් හා අනෙකුත් තොරතුරු පිළිබඳ බොත්තම් බ්‍රේල් ක්‍රමයට හෝ විශේෂ පහසු ක්‍රමයකට දැක්වීම සුදුසු වේ.

(11) තොරතුරු

(අ) තොරතුරු පුවරුව, ප්‍රමාණවත් තරමට ලොකු අකුරින් ලියන ලද කැපී පෙනෙන ප්‍රතිවිරුද්ධ වර්ණ භාවිතය ද, ආලෝකමත් කිරීම ද මගින් පහසුවෙන් කියවිය හැකි තත්ත්වයෙන් තිබිය යුතු ය.

(ආ) දුම්රිය කාල වේලාවල් පිළිබඳ මූලික විස්තරවලට අමතරව ගාස්තු චක්‍රය හා අනිකුත් ගමන් තොරතුරු බ්‍රේල් ක්‍රමයට දැක්වීම සුදුසු වේ.

(ඇ) දුම්රිය පැමිණීම් හා පිටත්වීම් පිළිබඳ තොරතුරු නිවේදනය කිරීම මගින් ප්‍රචාරය කිරීමට අමතරව විද්‍යුත් හෝ විදුලි සංඥා පුවරු භාවිතයෙන් දෘශ්‍යාමය වශයෙන් ද දැක්විය යුතු ය.

(12) දුම්රිය වේදිකා


(අ) දුම්රිය වේදිකාවේ කෙළවර සිට මි. මී. 800කට මෙහායින් දෘෂ්ටි ඌණතා පුද්ගලයන් සඳහා තිත් සහිත මාර්ගෝපදේශක ගල් පේළියක් තිබිය යුතු ය.

(ආ) දෘෂ්ටි ඌණතා සහිත මඟීන් වැටීමෙන් ආරක්ෂා කිරීම සඳහා වේදිකාවේ දෙකෙළවරටම වැටවල් සවි කළ යුතු ය.


(ඇ) වේදිකාවේ ගල් ඇල්ලූ, මතුපිට නොලිස්සන ද්‍රව්‍යයකින් සෑදිය යුතු ය.

(ඈ) වේදිකාව මත ඇති පඩිපේළි, දුරකථන කුටි සහ කසල බඳුන් දෘෂ්ටි ඌණතා ඇති තැනැත්තන්ගේ සහ රෝද පුටු භාවිත කරන්නන්ගේ ඔබ මොබ යාමට බාධා නොවිය යුතු ය.

(ඉ) වේදිකාව මත බංකු සවිකළ යුතු ය.




30 වන රූප සටහන - දුම්රිය ස්ථාන ප්‍රවේශය




31 වන රූප සටහන - ටිකට් විකිණීමේ යන්ත්‍රය


14. ප්‍රසිද්ධ ගොඩනැගිලි සැලසුම් කිරීමේ දී අනුගමනය කළ යුතු නිර්මාණ සැලසුම්

(1) ජනෙල් :

(අ) ජනෙල්වල හැඩල/පාලක රෝද පුටුවල සිට භාවිත කළ හැකි උසකින් තිබිය යුතු ය.

(ආ) රෝද පුටු භාවිත කරන්නන්ට අවහිරයකින් තොරව අවට බැලීම සඳහා ජනෙල්වල එක් කොටසක් අවට දිස්වන සේ තිබිය යුතු ය.

(ඇ) රෝද පුටු භාවිත කරන්නන්ට ජනෙල් රෙදි හෝ ආලෝක පාලකවලට ප්‍රවේශවිය හැකි විය යුතු ය.




32 වන රූප සටහන - ජනෙල්


(2) නිදන කාමර :

(අ) ඇඳ වටා අවකාශය රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රවේශවීම සඳහා ප්‍රමාණවත් විය යුතු ය.

(ආ) ඇඳ වටා අවකාශයේ රෝද පුටු භාවිත කරන්නකුට තනිවම පුටුවෙන් මාරුවීම සඳහා හෝ උදව්කරුවකුගේ ආධාරයෙන් මාරුවීම සඳහා හෝ ප්‍රමාණවත් ඉඩක් තැබිය යුතු ය.

(ඇ) ඇඳ, රෝද පුටු භාවිත කරන්නකුට පහසුවෙන් මාරුවිය හැකි පරිදි පොලවේ සිට සුදුසු උසකින් යුක්ත විය යුතු ය.

(ඈ) ඇඳක වැතිර සිටින අයකුට පහසුවෙන් යමක් ගත හැකි පරිදි සුදුසු උසකින් යුත් මේසයක් ඇඳ අසල තිබිය යුතු ය.




33 වන රූප සටහන - නිදන කාමර


(3) බේසම (34 වන රූප සටහන) :

(අ) බේසම, රෝද පුටු භාවිත කරන්නකුට පහසුවෙන් ප්‍රවේශවිය හැකි ස්ථානයක ගැලපෙන උසකින් සවිකළ යුතු ය.

(ආ) බේසම සවිකිරීමේ දී රෝද පුටු භාවිත කරන්නන්ට සුදුසු පරිදි දණහිස් සහ පාද තැබීමේ අවකාශ ඇති බවට වගබලා ගත යුතු ය.

(ඇ) බේසම ඉදිරිපස රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් නිදහස් අවකාශයක් තිබිය යුතු ය.

(ඈ) කැඩපත රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රයෝජනයට ගත හැකි පරිදි සවිකළ යුතු ය.




34 වන රූප සටහන - බේසම

(4) මුළුතැන් ගෙය (35 වන රූප සටහන) :

(අ) පොලොව මතුපිට නොලිස්සන ද්‍රව්‍ය වලින් සකසා තිබිය යුතු ය.

(ආ) වැඩ කරන ස්ථාන, සෝදන බේසම හා පිසුම් මේස එකම මට්ටමකට රෝද පුටු භාවිත කරන්නන් සඳහා සුදුසු උසකින් තිබිය යුතු ය.

(ඇ) වැඩ කරන ස්ථාන සහ සෝදන බේසම යට ප්‍රමාණවත් පරිදි දණහිස් තැබීමේ අවකාශයක් තිබිය යුතු ය. (36 වන රූප සටහන)


(ඈ) වැඩ කරන ස්ථාන, සෝදන බේසම් හා පිසුම් රාක්ක හෝ උදුන් අතර, රෝද පුටුවලට පහසුවෙන් එහා මෙහා යා හැකි බිම් අවකාශයක් තිබිය යුතු ය.

(ඉ) පයිප්ප ලීවර මිට සහිත ඒවා වීම වඩාත් සුදුසු ය.


(ඊ) පිසුම් පහසුකම්වලට සම්බන්ධ පාලන කරාම හෝ බොත්තම් ඇත්නම් ඒවා උපකරණ ඉදිරිපසින්, විවිධාකාර ආබාධිත තත්ත්වයන්ගෙන් යුත් පුද්ගලයන්ට පහසුවෙන් හා ආරක්ෂිතව ක්‍රියාත්මක කළ හැකි පරිදි තිබිය යුතු ය.

(උ) සුදුසු තැන්වල දී පෝරණු දොරවල් පහළ අතට විවෘත කළ හැකි පරිදි සරනේරු යොදා තිබිය යුතු ය.

(ඌ) ඝන ඉන්ධන උදුන් භාවිත කරන්නේ නම් රෝද පුටු හෝ අත්වාරු භාවිත කරන පුද්ගලයන් හා අන්ධ පුද්ගලයන් සලකා ප්‍රමාණවත් ක්‍රියාකරවීමේ අවකාශයක් හා ආරක්ෂාවක් සැලසෙන සේ ඒවා නිර්මාණය කළ යුතු ය.




35 වන රූප සටහන - මුළුතැන් ගෙය




36 වන රූප සටහන - වැඩකරන බංකුව

(5) ගබඩා කිරීමේ ඉඩකඩ :

(අ) දොරවල් අසල රෝද පුටුවක් (හකුලා හෝ නොහකුලා) තැබීම සඳහා අවකාශය තැබිය යුතු ය.

(ආ) විවිධ වර්ගයේ ගබඩා කිරීමේ ඉඩකඩ (රාක්ක, අල්මාරි, කබඩ් හා ලාච්චු) රෝද පුටු භාවිත කරන්නන්ට ළඟාවිය හැකි සුදුසු උසකින් හා සුදුසු ගැඹුරකින් තැබිය යුතු ය. (37 හා 38 වන රූප සටහන්)


(ඇ) රෝද පුටුවක පා තැබීමේ කොටස සඳහා ඉඩ සැලසෙන පරිදි ගබඩා කිරීමේ ඒකක යටින් පහත් වූ කයිරුවක් තැබිය යුතු ය.

(ඈ) කබඩ් හා ලාච්චුවල අල්ලු සීමිත ග්‍රහණ හැකියාවක් හා ඇදීමේ ශක්තියක් සහිත පුද්ගලයන්ට පහසුවෙන් අල්ලාගත හැකි හැඩයකින් යුක්ත විය යුතු ය.


(ඉ) නේවාසික ආයතනවල සිටින සෑම නේවාසිකයකුට ම වැසිය හැකි ලාච්චු සැපයිය යුතු ය.

(ඊ) ශීතකරණය රෝද පුටු භාවිත කරන්නන්ට පහසුවෙන ප්‍රයෝජනයට ගතහැකි ආකාරයේ උසකින් හා ගැඹුරකින් යුක්ත විය යුතු ය.

(උ) රෝද පුටු භාවිත කරන්නන්ට කබඩ්වල හා ශීතකරණවල විවෘත දොරවල් වටා එහා මෙහා යාමට ප්‍රමාණවත් බිම් අවකාශයක් සැපයිය යුතු ය.




37 වන රූප සටහන - ගබඩා කිරීමේ අවකාශය





38 වන රූප සටහන - අල්මාරිය


(6) මේස :

(අ) මේසවල රෝදපුටු භාවිත කරන්නන් සඳහා අවකාශයක් සැපයිය යුතු ය.

(ආ) රෝදපුටු භාවිත කරන්නන්ට මේස වෙතට ප්‍රවේශවීම සඳහා අවකාශයක් සැපයිය යුතු ය. (39 හා 40 වන රූප සටහන්)





39 වන රූප සටහන - මේසයට ප්‍රවේශය




40 වන රූප සටහන - මේසය වෙත ප්‍රවේශය

(7) ස්විච් සහ පිටත උපාංග :

ස්විච් සහ පිටත උපාංග රෝද පුටු භාවිත කරන්නන්ට පහසුවෙන් ළඟාවිය හැකි පරිදි සුදුසු උසකින් හා ස්ථානයකින් සවිකර තැබිය යුතු ය.




41 වන රූප සටහන - ස්විච් සහ පිටත උපාංග


(8) ආලෝකකරණය :

(අ) ප්‍රමාණවත් වූද, මනාසේ බෙදා හරින ලද්දා වූ ද, ආලෝක ක්‍රමයක් තිබිය යුතු ය. ප්‍රමාණයට වඩා දීප්තිමත් ආලෝකයෙන් දැස් පීඩාවට පත්වීම වැලැක්විය යුතු ය.

(ආ) තරප්පුවල ප්‍රමාණවත් ආලෝකයක් සපයා තිබිය යුතු ය.

(9) පොදු දුරකථන :

(අ) දුරකථන ස්ථාන අසල, රෝද පුටු භාවිත කරන්නකුට ඉදිරිපසින් හෝ සමාන්තරව ප්‍රවේශවීමට ප්‍රමාණවත් බිම් අවකාශයක් තැබිය යුතු ය. (42 වන රූප සටහන)




42 වන රූප සටහන - දුරකථන

(ආ) කුටිවල දොරවල් හා සවිකල ආසන රෝද පුටු භාවිත කරන්නන් දුරකථන කරා හෝ ඒ කෙරෙන් හෝ ප්‍රවේශවීමට බාධාකාරී නොවිය යුතු ය. සවිකළ ආසනවලට විකල්පයක් වශයෙන් දුරකථන ස්ථානවල අකුලන ආසන සවිකළ හැකි ය.

(ඇ) දුරකථනයක ඉහළම කොටසට, වාඩි වූ පුද්ගලයකුට පහසුවෙන් ළඟාවිය හැකි විය යුතු ය.

(ඈ) දුරකථනවලට පහළින් දණහිස් තැබීම සඳහා අවකාශයක් තැබිය යුතු ය.

(ඉ) දුරකථනවලට බොත්තම් තද කිරීමේ පාලක තිබිය යුතු ය.

(ඊ) දුරකථනයේ සිට අත්කථනයට දිගු වයරයක් සවිකළ යුතු ය.

(උ) ශ්‍රවණාබාධික පුද්ගලයන් සඳහා විදුලි සංදේශ උපකරණ (ටීඩීඩී) දුරකථන කුටි අසල පිහිටුවිය යුතු ය. ඒවා කෙටි පණිවුඩ සේවාවන් සහිත විය යුතු ය.

(ඌ) ශ්‍රවණාබාධිත පුද්ගලයන් සඳහා වූ දුරකථන "(ටීඩීඩී)" සංකේතයෙන් හඳුනාගත හැකි විය යුතු ය.

(එ) ගෙවන දුරකථන ශ්‍රව්‍ය ආධාරක භාවිතා කරන්නන්ට ගැලපෙන ඒවා විය යුතු අතර කෙටි පණිවිඩ සේවා පහසුකම් ද සහිත විය යුතු ය.

(ඒ) ගෙවන දුරකථනවල ශබ්ද පාලක තිබිය යුතු ය.

(ඩ) කාර්යාල, වැඩ කරන ස්ථාන, හෝටල් කාමර හා නිවාසවලට ලැබෙන දුරකථන පණිවුඩ සම්බන්ධයෙන් ශ්‍රවණ ඌණතා සහිත පුද්ගලයන් සෝදිසියෙන් යුතුව සිටීම සඳහා දෘශ්‍ය දැනුම්දීමේ ක්‍රම සැපයිය යුතු ය.

(10) ආධාරක ශ්‍රවණ උපකරණ :

(අ) රැස්වීම් ප්‍රදේශ හා සාකච්ඡා හා රැස්වීම් කාමර සඳහා ශ්‍රවණ ඌණතා සහිත පුද්ගලයන්ගේ ප්‍රයෝජනය පිණිස ආධාරක ශ්‍රවණ උපකරණ සැපයිය යුතු ය.

(ආ) වෙළඳපොළෙහි විවිධ වර්ගයේ ආධාරක ශ්‍රවණ ක්‍රම ලබා ගැනීමට තිබේ. ශ්‍රවණය පෙරදැරි කරගත් ලූප, ගුවන් විදුලි සංඛ්‍යාත පද්ධති සහ Infrared සම්ප්‍රේක්ෂණ ක්‍රම මේ අතර වේ.

(ඇ) ශ්‍රවණ ඌණතා සහිත පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා ආධාරක ශ්‍රවණ උපකරණ –

නෘත්‍යාගාර, ප්‍රසංග ශාලා, ක්‍රීඩාංගන හා අනෙකුත් සංස්කෘතික කාර්ය සඳහා වන ස්ථානවල ද,

මහජන ප්‍රදර්ශනය සඳහා වූ කෞතුකාගාර, ගැලරි හා අනෙකුත් ස්ථානවල ද,

සත්වෝද්‍යාන හා විනෝද උද්‍යානවල ද,

සපයා තිබිය යුතු ය.

(11) සමාන පිටපත් යන්ත්‍ර :

සමාන පිටපත් යන්ත්‍ර ශ්‍රවණ ඌණතා සහිත පුද්ගලයන් සඳහා අගනා සන්නිවේදන මාර්ගයක් වන අතර, තැපැල් කාර්යාල, වාණිජ ප්‍රදේශ හා පොදු ස්ථානවල ඒවා සපයා තිබිය යුතු ය.

(12) සංඥා භාෂා පරිවර්තනය :

සංඥා භාෂා පරිවර්තකයන් සඳහා ප්‍රමාණවත් අලෝකය, උස් ව තැනූ වේදිකා හා හෙඩ්පෝන් සපයා තිබිය යුතු ය.

(13) බ්‍රේල් පහසුකම් :

(අ) උස් කල ආකෘතියක පිහිට වූ බ්‍රේල් සංකේත හෝ අක්ෂර, දෘෂ්ටි ඌණතා සහිත පුද්ගලයන්ගේ ප්‍රයෝජනය සඳහා ඔවුන් නිතර යන එන ස්ථානවල තිබිය යුතු ය.

(ආ) අක්ෂර හෝ සංකේත හා සියලුම සංඥාවල පසුබිම ඇසට පීඩා නොවන සීමාවකින් යුක්තවිය යුතු ය. එම සංඥා ඒවායේ පසුබිමට ප්‍රතිවිරුද්ධ ආකාරයෙන් කැපී පෙනෙන සේ තැබිය යුතු ය.

(ඇ) "කථා කිරීමේ සංඥා" සවිකළ යුතු ය.

(14) අනතුරු හැඟවීමේ ක්‍රම :

අනතුරු වලින් බේරීම සඳහා වූ වාචික අනතුරු හැඟවීම්, කම්පන අනතුරු හැඟවීම් හා අනතුරුවලින් ගැලවීමේ උපදෙස් පහත ආකාරයට සපයා තිබිය යුතු ය.

* හදිසි අනතුරු හැඟවීමේ ක්‍රම (උදා : කම්පන අනතුරු හැඟවීමේ හෝ වාචික අනතුරු හැඟවීම්) සවිකොට ඇත්නම් දෘෂ්ටි ඌණතා සහිත පුද්ගලයන්ට අනතුරු හැඟවීමේ ක්‍රමයක් ද එහි ඇතුළත්ව තිබිය යුතු ය.
* ශ්‍රවණ ඌනතා සහිත පුද්ගලයන් සඳහා දෘශ්‍ය අනතුරු හැඟවීමේ ක්‍රම සැපයිය යුතු ය.
* කොට්ටවලට කම්පන උපකරණ ඇතුලු අනතුරු හැඟවීමේ ක්‍රම පහසුවෙන් සම්බන්ධ කිරීම සඳහා අවකාශ සලසනු වස් ඇඳක් අසල සොකට් සවිකර තිබිය යුතු ය.

II වන උපලේඛනය

*I වන කොටස*

(7 වන නියෝගය)

(අ) පොදු ප්‍රවාහනය :

| *ප්‍රවාහන වර්ගය* | *කාර්ය සාධන පිරිවිතර* |
|---|---|
| (1) මාර්ගවල ප්‍රවාහනය | (අ) රජයේ සහ පෞද්ගලික ප්‍රවාහන සමාගම් ආදිය මගින් මිළට ගැනෙන අලුත් වාහන ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි පරිදි මෙහි II වන උපලේඛනයේ II වන කොටසේ නිර්මාණ සැළසුම් සහිතව තිබිය යුතු ය.<br>(ආ) දැනට භාවිතයේ ඇති වාහන සඳහා මෙහි II වන උපලේඛනයේ II වන කොටසේ ඇති නිර්මාණ සැළසුම් සහිතව විකරණය කළ යුතු ය.<br>(ඇ) සෑම බස් රථයක ම අවම වශයෙන් ආසන දෙකක් (02) ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඇතුළු වන හා පිටවන දොරටුවලට ආසන්නයේ වෙන් කළ යුතු ය.<br>(ඈ) මෙහි II වන උපලේඛනයේ IIආ වන කොටසේ ඇති පිරිවිතර අනුව බස් නැවතුම් පලවල් ගොඩනැගිය යුතු ය. |
| (2) දුම්රිය ප්‍රවාහනය<br>(3) ගුවන් ප්‍රවාහනය<br>(4) පෙත් මං, මාර්ග සහ මහා මාර්ග | (අ) දැනට භාවිත වන දුම්රියවල එක් මැදිරියක් බැගින් ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සැලසෙන පරිදි සකස් කළ යුතු ය.<br>(ආ) අවම වශයෙන් එක් මැදිරියක් සඳහා ආසන හතර බැගින්වත් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කළ යුතු ය. මේවා ඇතුළුවීමේ හෝ පිටවීමේ දොරටු සමීපයේ තිබිය යුතු ය.<br>(ඇ) ආබාධ සහිත පුද්ගලයන්ට භාවිත කළ හැකි වැසිකිළි අවම වශයෙන් එකක්වත් ඉහත දැක්වූ ආසන සමීපයේ තිබිය යුතු ය.<br>(ඈ) ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ පහසුකම් සැලසෙන ලෙස මෙහි I වන උපලේඛනයේ IIආ කොටසේ නිශ්චිතව දැක්වෙන නිර්මාණ සැළසුම්වලට අනුව සියලුම ප්‍රධාන දුම්රිය ස්ථාන නවීකරණය කළ යුතු ය.<br>(ඉ) සෑම අභ්‍යන්තර ප්‍රවාහන ගුවන් යානාවකට ඇතුළුවීමේ හෝ පිටවීමේ දොරටු අසල අවම වශයෙන් ආසන දෙකක්වත් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කර තැබිය යුතු ය.<br>(ඊ) අවම වශයෙන් ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයේ වැසිකිළි එකක්වත් තිබිය යුතු ය.<br>(උ) අවශ්‍යතා ඇතුළත් සවිස්තර පදික නීතිරීති පද්ධතියක් ඇති කළ යුතු ය. |

II වන උපලේඛනය

*II වන කොටස*

1. මගී ප්‍රවාහන බස් රථ

(1) දොරවල්


(අ) බස් රථවල දොරවල් රෝද පුටු භාවිතා කරන්නන්ට ප්‍රමාණවත් පරිදි අවම වශයෙන් මි. මී. 900 පළලක් විය යුතු ය.

(ආ) පහත මට්ටමේ පඩියක් සවිකළ යුතු ය.

(ඇ) දොරටුවේ අත්වැටක්, පහතින් සවිකළ ආලෝකයක් හා නොලිස්සන ද්‍රව්‍ය වලින් තැනූ බිමක් තිබිය යුතු ය.

(ඈ) රෝද පුටු භාවිත කරන්නන් විසින් පාවිච්චි කිරීම සඳහා විදුලි සෝපානයක් හෝ බෑවුම් සහිත ප්‍රවේශ මාර්ගයක් පිහිටුවිය යුතු ය. (43 වන රූප සටහන)

(ඉ) අනෙක් මගීන්ට බස්රථයට නැගීමට හා ඉන් බැසීමට අවහිර නොවන පරිදි බස් රථයේ සුදුසු ස්ථානයක රෝද පුටුවක ඉඩකඩ තැබිය යුතු ය.





43 වන රූප සටහන - බස් රථ සෝපානය

(2) රෝද පුටු සඳහා අවකාශ (44 වන රූප සටහන)

(අ) එම අවකාශය තබා ඇති ස්ථානය බස් රථයේ ඇතුළතත් පිටතත්, රෝද පුටු ප්‍රවේශ පහසුකම් පිළිබඳ සම්මත සංකේතය මගින් පෙන්නුම් කළ යුතු ය.

(ආ) රෝද අතලු හා රෝද පුටු ආරක්ෂක පටි සැපයිය යුතු ය. (44 වන රූප සටහන)




44 වන රූප සටහන - බස් රථයක් තුළ රෝද පුටු සඳහා අවකාශය

(3) ආසන

ආබාධ සහිත වූ අය හෝ මහලු අය සඳහා බසයේ දොර අසලින් ආසන දෙකක් වෙන්කළ යුතු ය.

(4) බැසීම සඳහා නාද කෙරෙන සීනු

(අ) අසුන්ගෙන හෝ නැගිට සිටින මගීන්ට පහසුවෙන් ප්‍රවේශවිය හැකි තැන්වල බැසීම සඳහා නාද කරන සීනු ප්‍රමාණවත් සංඛ්‍යාවක් සපයා තැබිය යුතු ය.

(ආ) බැසීමේ සීනුව නාද කිරීම සඳහා තද කළ යුතු බොත්තම පැහැදිලිව පෙනෙන ප්‍රමාණවත් විශාලත්වයකින් යුත් එකක් විය යුතු ය.

(5) තොරතුරු සංඥා

(අ) බස් මාර්ගයක ඇති සියලුම නැවතුම්වල තොරතුරු බසය තුළ සුදුසු තැනක ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම තොරතුරු වාචිකව ද නිවේදනය කළ හැකි වීම වඩාත් වැදගත් ය.

(ආ) මාර්ගය හා ගමනාන්තය පිළිබඳ තොරතුරු බසයේ පිටත විශේෂයෙන් ම ඉදිරිපස විශාල අකුරින් දැක්විය යුතු ය. අඳුරේ කියවිය හැකිවීම සඳහා අභ්‍යන්තර ආලෝකයකින් එය ආලෝකමත් කර තිබිය යුතු ය.

(6) අත්වැටවල්

බස් රථයට ඇතුල්වන හා පිටවන ස්ථානවල නිසි පරිදි අත්වැටවල් සවිකර තිබිය යුතු ය.

2. මගී දුම්රිය

(1) දුම්රිය මැදිරි දොරවල් :–

(අ) දුම්රියවල දොරවල් රෝදපුටු භාවිතා කරන්නන්ට ප්‍රමාණවත් (අවම වශයෙන් මි. මී. 900) පළලින් යුක්ත විය යුතු ය.

(ආ) දුම්රිය දොර හා වේදිකාව අතර පරතරය නිරාපේක්ෂ අවමයක් දක්වා අඩුකළ යුතු ය. (45 වන රූප සටහන බලන්න.)

(2) ආසන අතර ප්‍රවේශය :–

ආසන අතර පිහිටි ඉඩකඩ රෝද පුටු භාවිත කරන්නන්ට යාමට ප්‍රමාණවත් පළලින් යුක්ත විය යුතු ය.

(3) රෝද පුටු සඳහා ඉඩකඩ :–

(අ) දොර තිබෙන පැත්තෙන් රෝද පුටු භාවිත කරන්නන් සඳහා ඉඩක් ලබාදිය යුතු ය.

(ආ) රෝද පුටු භාවිතා කරන්නන් සඳහා වෙන්කර ඇති ස්ථාන පිළිබඳව විශ්වමය වශයෙන් පිළිගත් සංකේතය මගින් දුම්රිය මැදිරියේ දැක්විය යුතු ය.

(ඇ) රෝද පුටු භාවිත කරන්නන්ට අල්ලාගෙන සිටීම සඳහා මුදු ආකාර පටියක් හෝ වෙනත් සුදුසු ආරක්ෂක ග්‍රාහකයක් සවි කළ යුතු ය.


(4) ආසන :–

ආබාධ සහිත පුද්ගලයන් සඳහා දොරවල් අසලින් සුදුසු ආසන සංඛ්‍යාවක් වෙන් කොට තැබිය යුතු ය.


(5) දැනුම්දීමේ සංඥා හා නිවේදන :–

(අ) දුම්රිය මාර්ගවල සිතියමක් සවිකර තැබිය යුතු ය.

(ආ) මාර්ගයේ ඇති දුම්රිය ස්ථානවල නම් නිවේදනය කළ යුතු අතර සෑම දුම්රිය මැදිරියක ම එය ප්‍රදර්ශනය කළ යුතු ය.




45 වන රූප සටහන - දුම්රිය මැදිරි, දුම්රිය මැදිරිදොර හා වේදිකාව අතර මට්ටම් වෙනස




46 වන රූප සටහන - දුම්රිය මැදිරිය ඇතුළත රෝද පුටු සඳහා ඉඩකඩ තැබීම

3. වෙනත් පොදු ප්‍රවාහන ක්‍රම

(1) කුලී රථ ගාල :–

(අ) අඩි පාරේ කුලී රථ නැවතුම් පළේ කුළුණින් මි. මී. 300ක් එපිටින් දෘශ්‍යා ඌනතා සහිත පුද්ගලයන්ට මාර්ගෝපදේශක ගල් පේළි දෙකක් සවිකර තිබිය යුතු ය.

(ආ) කුලී රථ නැවතුම්පළේ කුළුණ අඳුරේදීත් දිස්විය යුතු ය.

(ඇ) රෝද පුටු භාවිත කරන්නන්ට පහසුවෙන් කුලී රථයක් ගැනීමට හැකිවන පරිදි, කුලී රථ නැවතුමේ සිට මාර්ගයට ඇති හදිසි මට්ටම් වෙනස්කම් ඉවත් කළ යුතු ය.

(2) කුලී රථ අභ්‍යන්තරය :–

මගීන්ව සිය රෝද පුටුවල වාඩි වී සිටිමින් ම ඇතුළුවීමට හා පිටවීමට හැකිවන පරිදි කුලී රථ සකස් විය යුතු ය.

(3) ගුවන් තොටුපළ :–

විස්තර සඳහා "දුම්රිය නැවතුම්පළ" සඳහා වන නිර්මාණ සැලසුම් බලන්න.

(4) ගුවන් යානා අභ්‍යන්තරය

(අ) දොරවල් රෝද පුටු භාවිත කරන්නන් සඳහා සුදුසු පළලින් යුක්ත වීම.

(ආ) ආසන අතර මාර්ගය රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් විය යුතු ය.

(ඇ) *ගුවන් යානාව තුළ වැසිකිළි* :– විස්තර සඳහා "පොදු වැසිකිළි" සඳහා නිර්මාණ සැලසුම් බලන්න.

(ඈ) ස්වකීය හස්ත ආධාරකයන් විදුලි පිටමුවවලට සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය කරන මගීන්ට ඒ සඳහා අවකාශ සැලසෙන පරිදි "ප්ලග්" සපයා තිබිය යුතු ය.

(5) මුහුදු පාලම් හා ජැටි

*පර්යන්ත ගොඩනැගිල්ල* :– වේදිකාව හැර අනෙක් දේවල් "දුම්රිය නැවතුම්පළට" සමානව නිර්මාණය කළ යුතු ය.

(6) නෞකාවල හා පාරුවල අභ්‍යන්තර

(අ) දොරටු, රෝද පුටු භාවිත කරන්නන් සඳහා ප්‍රමාණවත් පළලින් යුක්ත විය යුතු ය.

(ආ) ආසන අතර, මාර්ගය රෝද පුටු භාවිත කරන්නන්ට ප්‍රමාණවත් පළලින් යුක්ත විය යුතු ය.

(ඇ) *නැවෙහි වැසිකිළි සඳහා* - 'පොදු වැසිකිළි' සඳහා නිර්මාණ සැලසුම් බලන්න.

(ඈ) යාත්‍රා කරන කාලය තුළ දී රෝද පුටු භාවිත කරන්නන්ගේ ස්ථාවරභාවය වැඩි කිරීම සඳහා අවශ්‍ය ආකාරයට ආරක්ෂක පටි සැපයිය යුතු ය.

## III වන උපලේඛනය

8(2) නියෝගය

### *දෘෂ්ටි ඌණතා ඇති තැනැත්තන් සඳහා වන ආරක්ෂක පියවර*


1. මාර්ගෝපදේශක ගල්

(අ) උඩට නෙරාගිය තිත් වර්ගයේ ගල් අනතුරු සංඥාවක් ලබා දෙයි. වැටීම් හෝ වෙනත් උපද්‍රව වැළැක්වීම, වැරදි පැත්තකට සංචරණය අධෛර්යමත් කිරීම හා කෙළවරක් හෝ සන්ධි ස්ථානයක් දැක්වීම එමගින් සිදු කෙරේ. (48 වන හා 49 වන රූප සටහන්)


(ආ) උඩට නෙරාගිය රේඛීය වර්ගයේ ගල් වලින් යායුතු නිවැරදි මාර්ගය දැක්වේ.

(ඇ) මාර්ගෝපදේශක ගල් සවි කළ යුතු ස්ථාන :–


* රථවාහන තදබදයක් ඇති ප්‍රදේශයක් ඉදිරිපස (49 වන රූප සටහන) ;
* පඩිපෙළක් හෝ බහු දුම්රිය මාර්ග මහා මාර්ග මාරුවකට ඇතුළුවන තැන හෝ ඉන් පිටවන තැන. (49 වන රූප සටහන) ;
* පොදු ප්‍රවාහන ගමනාන්තය හෝ ගමනාරම්භක ප්‍රදේශවල ඇතුළුවීම් හෝ පිටවීම් ස්ථානවල ;
* ගොඩනැගිල්ලකට පිවිසෙන මාර්ගයේ පැත්තේ ඇවිදීමට ඇති කොටස ;
* පොදු පහසුකමක සිට ළඟම පොදු ප්‍රවාහන ස්ථානයට මඟ පෙන්වන මාර්ගය ;
* ග්‍රාමීය ප්‍රදේශවල මාර්ගය ගැටියෙන් වෙන් කිරීම සඳහාත් පොදු ස්ථාන කරා ප්‍රවේශ විය හැකි ආකාරය දැක්වීම සඳහාත් විවිධ ප්‍රමාණයේ ගල් භාවිතා කළ හැකි ය.



47 වන රූප සටහන - මාර්ගෝපදේශක ගල් වර්ග




48 වන රූප සටහන - විවිධ මාර්ගෝපදේශක ගල් සැකසුම්




49 වන රූප සටහන - පඩි සහ ඇවිදීම සඳහා හරස් පාර

(2) නෙරාගිය වස්තුන්ගෙන් ආරක්ෂාව සැලසීම


(අ) දිසා දැක්වීමේ සලකුණු, කම්බි, ගස්වල අතු, කුඩාරම් කඹ, පොදු දුරකථන ස්ථාන, බංකු හා අලංකරණය සඳහා සවි කරන දෑ වැනි නෙරාගිය වස්තුන් දෘෂ්ඨි ඌණතා සහිත පුද්ගලයකුගේ සැරයටි සීමාව සැළකිල්ලට ගෙන පිහිටුවිය යුතු ය.

(ආ) තරප්පු මාර්ග හෝ විදුලි පඩිපෙළවල් යට පූර්ණ දෘශ්‍යාබාධිත අයට හා දෘෂ්ඨි ඌණතා සහිත පුද්ගලයන්ට අනතුරු හැඟවීම සඳහා බාධකයක් තිබිය යුතු ය. (52 වන රූප සටහන)


(ඇ) ඇවිදින මාර්ග, ශාලා, කොරිඩෝ, පැසේජ් මාර්ග, ආසන පේළි අතර හෝ වෙනත් සංසරණ අවකාශවල අනතුරු අවදානම අඩු කිරීම සඳහා හිස නොවදින බාධා රහිත ඉඩකඩක් තිබිය යුතු ය. (50 වන රූප සටහන)




50 වන රූප සටහන - නෙරාගිය වස්තුන්




51 වන රූප සටහන - තනිව පිහිටා ඇති වස්තූන්




52 වන රූප සටහන - උඩින් පැමිණිය හැකි උපද්‍රව


(3) සංඥා හා සළකුණු

(අ) සංඥා කැපී පෙනෙන වර්ණ වලින් යුක්ත විය යුතු ය. දෘෂ්ඨි ඌණතා සහිත අයට ස්පර්ශයෙන් තොරතුරු ලබාගත හැකි පරිදි කැටයම් එබ්බ වූ ආකාරයට සකස් කොට ඇත්නම් වඩාත් සුදුසු ය.

(ආ) විශ්වමය වශයෙන් පිළිගත් සරල සංකේත හා වෙනස පෙන්නුම් කෙරෙන වර්ණ (උදා :- ආරක්ෂාව හෝ පිටත්වනු සඳහා කොළපාට, අවදානම හෝ පරෙස්සම සඳහා කහ හෝ දුඹුරු පැහැයට හුරු කහපාට සහ අනතුරු සඳහා රතු පාට භාවිතා කළ යුතු ය.)

(ඇ) ගොඩනැගිල්ල මුළුල්ලේම පැහැදිලි සංඥා ක්‍රමයක් යොදා තිබිය යුතු ය. දිශාව වෙනස් කරන සෑම ස්ථානයක දීම එකම උසකින් එකම ක්‍රමයකට දැක්විය යුතු ය.

(ඈ) සංඥාවල උස 53 වන රූප සටහනට අනුකූල විය යුතු ය.



53 වන රූප සටහන - සංඥා පිහිටුවන උස



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.